# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1719/36 – 2011 අගෝස්තු 19 වැනි සිකුරාදා – 2011.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ එපාමුල්ල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්/වත්/2009/28 හා 2011.04.08 දිනැති සංශෝධිත ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5220ක් පමණ වූ වෙරළබඩතල්ගහවත්ත නමැති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් හා මායිම්වලින් යුක්ත ඉඩම් කොටස:

01. **කැබලි අංක 01 – වෙරළබඩතල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.5220ක් පමණ**

උතුරට: ෆ්‍රැන්සිස් ජයමහ හිමිකම් කියන වෙරළබඩතල්ගහවත්ත; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: පාර සහ වෙරළ; බටහිරට: වෙරළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2008/ඩී/469.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ව/18/82/2008.
2011 අගෝස්තු මස 11 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 166